## විවාහ සහතිකයක් ලබා ගැනීම.

**සුදුසුකම්**

ශ්‍රී ලාංකිකයෙක් තමන් පදිංචි පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ විවාහය සිදු වන්නේ නම් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විවාහ සහතිකය නිකුත් කිරීමට පුළුවන. අයදුම්කරු වයස 18 ට වැඩි විය යුතුය.

ඕනෑම අයදුම් කරුවෙකුට විවාහ සහතිකයක් ලබා ගැනීමට පුළුවන.

සටහන : අයදුම්කරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකකට අයත් නම් තමන් කැමති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකදි විවාහය සිදු කළ යුතුය.

**අයදුම් පත්‍රය**

| අයදුම් පත්‍ර අංකය සහ නම | විස්තරය |
|---|---|
| විවාහ සහතිකයක් සඳහා ඉල්ලුම් පත්‍රය හා ලේඛන පරීක්ෂා කිරීම පෝරම 121 | කසාදය ලේඛන ගත කිරීම. |
| විවාහය දැනුම් දීම පෝරම 100 | රෙජිස්ට්‍රාර් හට විවාහය සිදු කරන ස්ථානය පල්ලියක හෝ කෝවිලක පවත්වන්නේ නම් ඒ ගැන පිළිගත හැකි ලිපියක් ඉදිරිපත් කිරීම තමන්ගේ ආගමට අනුකූලව විවාහය සිදු කරන්නේ නම් ඒ ස්ථානයෙන් ගත් ලිපියක් |

විවාහ සහතිකයක් සඳහා ඉල්ලුම් පත්‍රය

විවාහය දැනුම් දීම

**පිළිවෙල පියවරෙන් පියවර (විවාහ සහතිකය නිකුත් කිරීම)**

පියවර 1 : අයදුම්කරු විසින් විමසුම් කාර්යාලයෙන් හෝ ලියාපදිංචි කිරීමේ නිලධාරීයාගෙන් හෝ ප්‍රාදේශීය ලේකම්ගෙන් විවාහ දැන්වීම් පත්‍රයක් ලබා ගත යුතුය.

පියවර 2 : අයදුම්කරු දැන්වීම් පත්‍රය සකස් කර පිරවිය යුතුය

පියවර 3 : අයදුම්කරු විසින් විමසීම් ලිපියක් හෝ ලියාපදිංචි කිරීමේ නිලධාරියාගෙන් හෝ ප්‍රාදේශීය ලේකම්ගෙන් අයදුම් පත්‍රයක් ලබාගත යුතුය.

පියවර 4 : අයදුම්කරු අයදුම්පත්‍රය සකස් කර පිරවිය යුතුය.

පියවර 5 : අයදුම්කරු අවශ්‍යය උපකාර තොරතුරු සැපයිය යුතුය

පියවර 6 : අයදුම් පත්‍රය ප්‍රාදේශීය ලේකම්ට තැපැලෙන් හෝ ප්‍රාදේශීය ලේකම්ට ගෙන ගොස් භාර දිය හැකිය.

පියවර7 : ප්‍රාදේශීය ලේකම්ට ලැබුණු අයදුම් පත්‍රය හා ලැබුණු දත්ත සියල්ලම නිත්‍යානුකූල බව පරීක්ෂා කර එම අයදුම් පත්‍රය අදාළ කෝවිලට හෝ පල්ලියට යවනු ලබයි.

පියවර 8 : අයදුම්කරුට තම විවාහ සහතිකය තැපැල් මගින් හෝ වෙනත් ක්‍රමයකින් ලබා ගත හැක.

සටහන : අයදුම්කරු නුසුදුස්සෙක් ලෙස තේරුනහොත් ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් අයදුම් පත්‍රය නුසුදුසු වීමට හේතුවද සමඟ නැවත අයදුම්කරුට එවනු ලබයි.

කාලසීමාව

ක්‍රියාවලියේ කාලසීමාව

කෝවිල හෝ පල්ලිය මගින් එය නීත්‍යානුකූල විවාහයක් බව සහතික කළ විට විවාහ සහතිකය දින 2 ක් 3 කින් ලැබේ.

ඉදිරිපත් කිරීමේ කාලසීමාව

පියවර 1 : විවාහ දැන්වීම් පත්‍රයක් ලබා ගැනීම

විවාහ දැන්වීම් පත්‍රය විමසුම් කාර්යාලයෙන් හෝ විවාහ ලේකම්ගෙන් ඕනෑම වැඩ කරන වේලාවකදී ලබා ගත හැක.

වැඩ කරන දවස් : සඳුදා සිට සිකුරාදා දක්වා

කවුළු විවෘත කරන වේලාවල් : පෙ.ව. 9.00 සිට ප.ව. 12.30 සහ ප.ව. 1.00 සිට ප.ව 3.00 දක්වා

නිවාඩු දිනයන් : ඕනෑම ප්‍රසිද්ධ සහ වෙළඳ නිවාඩු

පියවර 2 : විවාහ දැන්වීම් පත්‍රය භාර ගැනීම

අයදුම්පත්‍රය සෘජුව භාර දෙන විට කාලය අපතේ යෑමක් නැත. අයදුම්පත්‍රය තැපැල් කළ විට අයදුම්පත්‍රය අදාළ ස්ථානයට යාම සඳහා කාලය බොහෝ සෙයින් වැඩිවේ.

වැඩ කරන දවස් : සඳුදා සිට සිකුරාදා දක්වා (සඳුදා සහ බදාදා මුළු දිනයේම)

කවුළු විවෘත කරන වේලාවල් : පෙ.ව. 9.00 සිට ප.ව. 12.30 සහ ප.ව. 1.00 සිට ප.ව. 3.00 දක්වා

නිවාඩු දිනයන් : ඕනෑම ප්‍රසිද්ධ සහ වෙළඳ නිවාඩු

පියවර 3 : අයදුම් පත්‍ර ලබා ගැනීම

අයදුම්පත්‍ර විමසුම් කාර්යාලයෙන් හෝ ලියාපදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඕනෑම වැඩ කරන දවසක ලබා ගත හැක.

වැඩ කරන දවස් : සඳුදා සිට සිකුරාදා දක්වා

කවුළු විවෘත කරන වේලාවල් : පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා/ ප.ව. 1.00 සිට ප.ව. 3.00 දක්වා

නිවාඩු දිනයන් : ඕනෑම ප්‍රසිද්ධ සහ වෙළඳ නිවාඩු

**පියවර 4 : අයදුම්පත්‍රය භාර දීම**

අයදුම්පත්‍රය තැපැල් කළ විට අදාළ ස්ථානයට යාමට බොහෝ කාලය ගත කරයි. නමුත් අයදුම්පත්‍රය සෘජුව භාර දෙන විට කාලය අපතේ යෑමක් නැත.

වැඩ කරන දවස් : සඳුදා සිට සිකුරාදා දක්වා

කවුළු විවෘත කරන වේලාවල් : පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 සහ ප.ව. 1.00 සිට ප.ව. 3.00 දක්වා

නිවාඩු දිනයන් : ඕනෑම ප්‍රසිද්ධ සහ වෙළඳ නිවාඩු

නීත්‍යානුකූල කාලසීමාව : ජීවිත කාලය තුලදී

**සේවයට අදාළ ගෙවීම්**

එක් පිටපතකට රු. 100.00 බැගින් අය කරයි.

**සටහන:**
මුද්දර එවනවා නම් ලියාපදිංචි කවරයක දමා එවීම ඔබ ඉල්ලූම් කළ සහතිකය ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු නම් ලියාපදිංචි රාජකාරිය ලියුම් කවරයට ඇතුළත් කළ යුතුය.

**අවශ්‍ය උපකාර ලේඛන**

- ජාතික හැඳුනුම්පත සහ සාක්ෂිකාරයන් දෙදෙනෙක්
- සුදුසු නම් විවාහය හා දික්කසාදය _ දික්කසාද සහතිකය
- විවාහ වී සිටි සහකරුගේ _ මරණ සහතිකය

**විශේෂ කරුණු**

මෙම සේවාව සඳහා විශේෂ අවස්ථා නැත.

**ආයතනයේ තොරතුරු**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - යක්කලමුල්ල

පූර්ණිමා අබේසිරිගුණවර්ධන මිය

දුරකථන : 091-2286132

ෆැක්ස් අංක : 091-2286132

විද්‍යුත් තැපැල : ds@yakkalamulla.ds.gov.lk

වෙබ් අඩවිය : www.yakkalamulla.ds.gov.lk